ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**පුවත්පත් නිවේදනය**

**<u>ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය ඉන්දියාවේ සංචාරයක නිරත වේ</u>**

ශ්‍රී ලංකාවේ කාන්තා සහ ළමා කටයුතු අමාත්‍ය ගරු සරෝජා සාවිත්‍රී පෝල්රාජ් මැතිනිය ප්‍රමුඛ ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ 19 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිසක් 2026 මැයි 10 සිට 16 දක්වා ඉන්දීය සංචාරයක නිරත වූහ. මෙම දූත පිරිසට පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් 15 දෙනෙකු සහ පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමිය ඇතුළු පාර්ලිමේන්තු නිලධාරිනියන් 4 දෙනෙකු ඇතුළත් විය.

2. මෙය ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ පළමු ඉන්දීය සංචාරයයි. මෙම සංචාරය ප්‍රජාතාන්ත්‍රික රාජ්‍යයන් සඳහා පාර්ලිමේන්තු පර්යේෂණ සහ පුහුණු ආයතනය (PRIDE) විසින් ඉන්දීය රජයේ විදේශ කටයුතු අමාත්‍යාංශය හා එක්ව සංවිධානය කර තිබිණ. මෙම සංචාරය ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පාර්ලිමේන්තු සහයෝගිතාවය ගැඹුරු කිරීමට සහ දෙරටේ නායිකාවන් අතර සබඳතා ශක්තිමත් කිරීම සඳහා අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ සහ ශ්‍රී ලංකා ජනාධිපති අතිගරු අනුර කුමාර දිසානායක මැතිතුමාගේ ඒකාබද්ධ දැක්ම හා අනුකූලව සිදු කරන ලදී.

3. සංචාරය අතරතුරදී, දූත පිරිස ලෝක් සභා කථානායක ශ්‍රී ඕම් බිර්ලා මහතා සහ ඉන්දීය රජයේ කාන්තා සහ ළමා සංවර්ධන අමාත්‍ය ශ්‍රීමතී අන්නපූර්ණා දේවි මහත්මිය ද හමු වූහ. ඔවුහු දිල්ලි මහ ඇමති ශ්‍රීමතී රේඛා ගුප්තා මහත්මිය ද හමු වූහ. කාන්තාවන් විසින් මූලිකත්වය ගන්නා සංවර්ධනය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, මාතෘ සහ ළමා සුබසාධනය, රැකවරණ ආර්ථික වැඩසටහන් සහ දේශපාලනය සහ පාලනය තුළ කාන්තා නායකත්වය වැනි ක්ෂේත්‍රයන්හි සහයෝගීතාවය වර්ධනය කිරීම සහ මනා පිළිවෙත් හුවමාරු කරගැනීම සම්බන්ධයෙන් සාකච්ඡාවන් හි අවධානය යොමු විය.

4. දිල්ලි පොලිසිය, අන්ගන්වඩි සේවකයන් සහ කාන්තා ස්වයං උපකාර කණ්ඩායම් සමඟ අන්තර්ක්‍රියා ඇතුළු වැඩසටහන් තුළින් ශ්‍රී ලංකා දූත පිරිසට ඉන්දියාවේ පාලන ආකෘතීන් සහ කාන්තා සවිබලගැන්වීම සහ ළමා සුබසාධනය යන ක්ෂේත්‍ර තුළ විවිධ වැඩසටහන් සම්බන්ධයෙන් පුළුල් අවබෝධයක් සංචාරය තුළ දී ලබා දෙන ලදී. දූත පිරිස ඉන්දියාවේ අනන්‍ය අනන්‍යතා අධිකාරියේ සංචාරයක ද නිරත වූ අතර එහිදී සියලු දෙනා ඇතුළත් වන පරිදි සේවාවන් ලබා දීම සඳහා ඩිජිටල් අනන්‍යතාවයේ කාර්යභාරය

අවධාරණය කරන ලදී. FICCI කාන්තා සංවිධානය (FLO) විසින් දූත පිරිස සඳහා ආර්ථික වර්ධනයේ සහ නවෝත්පාදනයේ නියමුවන් ලෙස කාන්තාවන්ගේ කාර්යභාරය යන මැයෙන් වටමේස සාකච්ඡාවක් ද සංවිධානය කර තිබිණ. තව ද, PRIDE ආයතනය විසින් නීති සම්පාදන ක්‍රියාවලීන්, ස්ත්‍රී පුරුෂභාවය හා සම්බන්ධ අයවැයකරණය, පාර්ලිමේන්තු කමිටු ක්‍රමවේද සහ ප්‍රජාතාන්ත්‍රික රාජ්‍යයන් දෙක අතර අදාළ අනන්‍යතා කරුණු සම්බන්ධයෙන් විවිධ සැසි ද සංවිධානය කර තිබිණ.

5. දෙරට අතර සංස්කෘතික සබඳතා වර්ධනය කරමින් දූත පිරිස අග්‍රා හි ටාජ් මහල නැරඹීමට ද ගියහ. නව දිල්ලි සංචාරය අතරතුරදී ඔවුහු ඉන්ඩියා ගේට් සහ යුධ ස්මාරකය මෙන්ම රායි පිතෝරා සංස්කෘතික සංකීර්ණයේ පැවති පිප්රාහ්වා ධාතු ප්‍රදර්ශනය ද නැරඹූහ.

6. මෙම සංචාරය තුළින් පාර්ලිමේන්තු නියැළීම් ගැඹුරු කිරීමට සහ සංවර්ධන අත්දැකීම් බෙදා හදා ගැනීමට ඉන්දියාව සහ ශ්‍රී ලංකාව දක්වන අඛණ්ඩ කැපවීම පිළිබිඹු විය. එසේම, මෙම සංචාරය තුළින් කාන්තාවන් විසින් මූලිකත්වය ගන්නා පරිවර්තනය සහ දෙරටෙහි සියලු දෙනා ඇතුළත් වන තිරසාර සංවර්ධනය ඉහළ නැංවීම සඳහා ආයතනික සහයෝගීතාවයේ වැදගත්කම අවධාරණය කරන ලදී.

***

කොළඹ

*2026 මැයි 18*